අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/06/11-2

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.05 06

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම විදුහල්පතිවරුන්

**<u>අ.පො.ස. (උසස් පෙළ) සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ජනාධිපති අරමුදල ඒකාබද්ධව පිරිනැමෙන ශිෂ්‍යත්ව වැඩසටහන - 2024/2025</u>**

2022/2023 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට එම විභාගය සමත්ව අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීමට සුදුසුකම් ලැබ දැනට <u>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස හදාරනු</u> ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ජනාධිපති අරමුදල ඒකාබද්ධව දිවයින පුරා පිහිටි අධ්‍යාපන කලාප 100 අතරින් තෝරා ගනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යත්ව 5,000ක් ලබා දීමේ වැඩසටහනක් ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙම වැඩසටහන දිවයිනේ සියලුම අධ්‍යාපන කලාපවල ක්‍රියාත්මත කිරීමට නියමිත අතර මේ යටතේ එක් කලාපයකට පිරිනැමෙන අවම ශිෂ්‍යත්ව සංඛ්‍යාව 50ක් වේ. කෙසේ වුවද එක් කලාපයක් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබුණහොත් එම කලාපය සඳහා වෙන් කළ ශිෂ්‍යත්ව සංඛ්‍යාවෙන් ඉතිරි වන ශිෂ්‍යත්ව සංඛ්‍යාව අනෙකුත් කලාපවලින් ලැබී ඇති සුදුසුකම් සහිත ශිෂ්‍යත්ව අයදුම්පත්වල ලකුණු මට්ටම් සලකා එම කලාප සඳහා වෙන් කරනු ලැබේ. මේ සඳහා සුදුසුකම් ලබන ශිෂ්‍යත්වලාභීන්ට 2024 මැයි මස සිට අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටින මාසය තෙක් හෝ මාස 24ක උපරිම කාලසීමාවකට යටත්ව හෝ ශිෂ්‍යත්ව මුදල් ප්‍රදානය කරනු ලැබේ.

**01. <u>ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම්</u>**

1.1 2022 (2023) වර්ෂයේදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට විභාගය සමත්ව අ.පො.ස. (උසස් පෙළ) සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස හදාරනු ලබන ශිෂ්‍යයකු / ශිෂ්‍යාවක වීම.

1.2 රජයේ පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍යයකු / ශිෂ්‍යාවක වීම.

1.3 ඉල්ලුම්කරුගේ පවුලේ මාසික අදායම රුපියල් 100,000.00 නොඉක්මවීම.

**සැ.යු :** මේ වන විටත් අයදුම්පත් කැඳවා ඇති ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති අ.පො.ස. (උසස් පෙළ) සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් එම වැඩසටහන සඳහා තෝරාගෙන ඇත්නම් නැවත වරක් අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. එසේ පළාත් මට්ටමින්/කලාප මට්ටමින් තෝරාගෙන ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නාම ලේඛනය ජනාධිපති අරමුදලේ නිල Face Book පිටුවෙහි පළ කර ඇත.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov

**02. <u>අයදුම්පත් ඉදිරිපත් කිරීම</u>**

2.1 මෙම ශිෂ්‍යත්වය ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය (ඇමුණුම 01) හා ඊට අදාළ උපදෙස් පත්‍රිකාව (ඇමුණුම 02) තම පාසලේ දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීමට සියලු ම විදුහල්පතිවරුන් විසින් කටයුතු කළ යුතු ය.

2.2 සියලුම පාසලකම විදුහල්පතිවරුන් මෙම ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳව 2022 (2023) වර්ෂයේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව දැනට අ.පො.ස. (උසස් පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරන සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කළ යුතු ය.

2.3 මේ සම්බන්ධ වැඩිදුර තොරතුරු සහ අයදුම්පත්‍රය ජනාධිපති අරමුදලේ www.presidentsfund.gov.lk, අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk වෙබ් අඩවිවල සහ ජනාධිපති අරමුදලේ නිල Face Book පිටුව වන www.facebook.com/ president.fund හි නියමිත කාලසීමාව තුළ පළ කිරීමට කටයුතු කෙරේ.

2.4 ඉහත අංක 01හි සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති සහ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට කැමැති ශිෂ්‍ය ශිෂ්‍යාවන් අදාළ අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය (ඇමුණුම 01) අනුව අයදුම්පත්‍රයක් සකස් කරගත යුතුය. එසේ සකස් කරගත් අයදුම්පත්‍රය සම්පූර්ණ කර තම පන්තිභාර ගුරුතුමා/ගුරුතුමියගේ අත්සන සහිත ව අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු නිවැරදි බවට අදාල පාසලේ විදුහල්පති විසින් සහතික කළ යුතු ය. ශිෂ්‍යත්ව අයදුම්පත්‍රය සඳහා ලබා දී ඇති ලකුණු සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල පිටපත් විදුහල්පති විසින් සහතික කර ශිෂ්‍යත්ව අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

2.5 ඉල්ලුම්කරුගේ පවුලේ මාසික ආදායම ග්‍රාම නිලධාරි විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව අයදුම්පතේම සහතික කර තිබිය යුතු අතර ආදායම් වාර්තා ලබා ගැනීම අවශ්‍ය නොවේ.

2.6 ඉහත 2.4 හා 2.5 නිර්දේශ /අත්සන් සහිත අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය සඳහා ඉදිරිපත්කළ යුතු ය.

2.7 සෑම ශිෂ්‍යත්වලාභියෙකුගේම නමින් ලංකා බැංකුවේ, මහජන බැංකුවේ හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක් තිබිය යුතු අතර, එම ඉතිරිකිරීමේ ගිණුමේ තොරතුරු ඇතුළත් පිටුවේ සහ ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ ජාතික හැඳුනුම්පතේ පැහැදිලි පිටපතක් අදාළ පාසලේ විදුහල්පති විසින් සහතික කර ඉදිරිපත්කළ යුතු ය.

2.8. ඒ අනුව සියලුම සහතිකවල සහතික කරන ලද පිටපත් සහිත නිසි පරිදි සම්පූර්ණ කළ **අයදුම්පත්‍රය 2024 මැයි මස 22** දින හෝ ඊට පෙර පහත ලිපිනයේ පිහිටි ජනාධිපති අරමුදලේ කාර්යාලය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.

**ලේකම්,**
**ජනාධිපති අරමුදල,**
**අංක 35, 3 වන මහල, ලේක් හවුස් ගොඩනැගිල්ල,**
**ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ 10**

2.9. එසේ ම අයදුම්පත්‍රය ඉදිරිපත්කල ලියුම් කවරයේ ඉහළ වම් පස " පාසලේ නම හා අධ්‍යාපන කලාපය " පැහැදිලිව සටහන් කල යුතුය.

**03.** තෝරා ගැනීමේ පටිපාටිය

3.1 නියමිත දිනට පෙර නිසි පරිදි සම්පූර්ණ කරන ලද ශිෂ්‍යත්ව අයදුම්පත් ජනාධිපති අරමුදල වෙත එවිය යුතු අතර අයදුම්පත් ලද වහාම එම අයදුම්පත් කලාප මට්ටමින් වර්ගීකරණය කර අදාළ මූලික සුදුසුකම්, නිර්ණායක හා ලකුණු පටිපාටිය අනුව තෝරාගනු ලබන ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛනය සකස් කරනු ඇත.

3.2 තෝරාගනු ලැබූ ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛනය 2024 මැයි මස 30 වන දින ජනාධිපති අරමුදලේ නිල Face Book පිටුවේ පළ කිරීමට කටයුතු කරනු ලබන අතර, මෙම කටයුතු අවසන් වූ වහාම ශිෂ්‍යත්වලාභීන් වෙත ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**04.** නිර්ණායක හා ලකුණු පටිපාටිය

අයදුම්කරුවෙකුට ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100කි.

**4.1** <u>පවුල සම්බන්ධ තොරතුරු (අයදුම්පත්‍රයේ අංක 01)</u>

| | | |
|---|---|---|
| 4.1.1 | පවුලේ වයස අවුරුදු 21ට අඩු දරුවන් සංඛ්‍යාව දෙදෙනෙකු / ඊට වැඩිනම් | ලකුණු 04 |
| 4.1.2 | දෙමව්පියන් දෙදෙනාම අහිමිවීම | ලකුණු 06 |
| 4.1.3 | දෙමව්පියන් නොමැති භාරකරුවෙකු ළඟ සිටීනම්<br>(එසේ නම් නීත්‍යානුකූල භාරකාරත්වය සනාථ කරන ලේඛන වල පිටපත් ඇමිණිය යුතුය.) | ලකුණු 02 |
| 4.1.4 | දෙමව්පියන්ගෙන් එක් අයකු අහිමිවීම | ලකුණු 03 |
| 4.1.5 | ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ පූර්ණ ශාරීරික දුබලතාවකදී<br>(අර්ධ දුබලතාවක් නම් ලකුණු 05ක් පමණක් හිමි වේ) | ලකුණු 10 |

(උපරිම ලකුණු 25)

සැ.යු. :- දරුවන් ලෙස සලකනු ලබන්නේ දෙමව්පියන්ගෙන් යැපෙන අවුරුදු 21ට අඩු අවිවාහක දරුවන් ය. ශාරීරික දුබලතා පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් සහතික කළ යුතු යි.

**4.2** <u>අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල (අයදුම්පත්‍රයේ අංක 02)</u>

4.2.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ අනිවාර්ය විෂය සඳහා

| | | | |
|---|---|---|---|
| විශිෂ්ට සාමාර්ථයක් සඳහා | (A) | - | ලකුණු 08 |
| අධි සම්මාන සාමාර්ථයක් සඳහා | (B) | - | ලකුණු 06 |
| සම්මාන සාමාර්ථයක් සඳහා | (C) | - | ලකුණු 04 |
| සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | (S) | - | ලකුණු 02 |

4.2.2 **<u>කාණ්ඩ විෂය සඳහා එක විෂයයකට ලකුණු 01 බැගින් විෂය 02ක උපරිමයකට යටත් ව ලකුණු 02ක් ලබා දිය යුතු ය.</u>**

(උපරිම ලකුණු 50)

**4.3** <u>ක්‍රීඩා (අයදුම්පත්‍රයේ අංක 03)</u>

වොලිබෝල්/ දැල්පන්දු/ පාපන්දු/ පැසිපන්දු/ ක්‍රිකට්/ එල්ලේ/ බැඩ්මින්ටන්/ කබඩි/ රගර්/ හොකි/ මළල ක්‍රීඩා/ චෙස්/ කැරම්/ ටෙනිස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාටේ/ මේස පන්දු / වෙනත්

| | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| • පළමුවන ස්ථානය | 05 | 07 | 09 |
| • දෙවන ස්ථානය | 04 | 05 | 08 |
| • තුන්වන ස්ථානය | 02 | 03 | 06 |
| • නායකත්වය | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

**4.4 සෞන්දර්ය හා විෂය සමගාමී ක්‍රියාකාරකම් (අයදුම්පතුයේ අංක 04)**

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශූරයෝ තරගාවලිය
- ජාතික භාෂා හා සාහිත්‍ය තරඟ/ විවාද/ කථික/ නිවේදන/ දැනුම මිනුම/ චිත්‍ර/ නැටුම්/ වාදනය/ ගායනය/ වේදිකා නාට්‍ය
  විෂය ප්‍රවීණතා ජයග්‍රහණ
- ශිෂ්‍යභට/ බාලදක්ෂ/ බාලදක්ෂිකා/ ප්‍රථමාධාර/ පරිසර නියමු/ වෙනත්

| | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| • පළමුවන ස්ථානය | 05 | 07 | 09 |
| • දෙවන ස්ථානය | 04 | 05 | 08 |
| • තුන්වන ස්ථානය | 02 | 03 | 06 |
| • නායකත්වය | 01 | 01 | 01 |

**4.5 ශිෂ්‍ය නායකත්වය (අයදුම්පතුයේ අංක 05)**

පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක/ උපප්‍රධාන ශිෂ්‍ය නායක - ලකුණු 05
ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/ කනිෂ්ඨ) - ලකුණු 04
පන්ති නායක - ලකුණු 02
(උපරිම ලකුණු 05)

සැ.යු. :-

- ඉහත 4.3 සහ 4.4හිදී, එක් ශිෂ්‍යයකුට/ ශිෂ්‍යාවකට එකම විෂය සමගාමී කටයුත්තක් සඳහා ජාතික, පළාත් හා කලාප යන මට්ටම් සියල්ලටම ලකුණු ලබා නොදිය යුතුය. ලකුණු දීමේදී සැලකිල්ලට ගත යුත්තේ ඉහළම ලකුණු මට්ටම පමණි.
- ඉහත 4.5හිදී ලකුණු දීමේදී සැලකිල්ලට ගත යුත්තේ ඉහළම ලකුණු මට්ටම පමණි.

## 05. ශිෂ්‍යත්ව ප්‍රදානය

5.1 ද්විතියික අධ්‍යාපනය සඳහා අදාළ වර්ෂයේ 12 වන ශ්‍රේණියට ඇතුළත්ව අ.පො.ස.(උසස් පෙළ) සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස හදාරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතුරින් තෝරාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අ.පො.ස. (උසස් පෙළ) ඉගෙනුම ලබන අවුරුදු 02 ක කාල සීමාව තුළ එක් මසකට රු.6,000/- බැගින් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටින මාසය තෙක් ශිෂ්‍යත්ව 2024 මැයි මාසයේ සිට වාරික 24 ක් ලබා දෙනු ලැබේ. අදාළ ශිෂ්‍යත්ව මුදල මාසික ව ශිෂ්‍යත්වලාභීන් නමින් පවතින බැංකු ගිණුමකට පමණක් ඍජු ව ම බැර කරනු ලැබේ. ශිෂ්‍යත්වලාභියාගේ නමට බැංකු ගිණුමක් නොමැතිනම්, නව බැංකු ගිණුමක් විවෘත කළ යුතු ය.

5.2 අදාළ ශිෂ්‍යත්වලාභියා යම් හේතුවක් නිසා ඉගෙනුම ලබන පාසලෙන් ඉවත්ව වෙනත් පාසලකට ඇතුළත් වූයේ නම්, ඒ බව තහවුරු කරන ලිපියක් විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට ලබාදිය යුතුය. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඒ බව ජනාධිපති අරමුදල වෙත කඩිනමින් දැනුම් දිය යුතුය.

5.3 අදාළ ශිෂ්‍යත්වලාභියා විසින් ද තමා වෙනත් පාසලකට ඇතුලත් වූ බව සඳහන් කරමින් , අලුතින් ඇතුළු වූ පාසලේ නම සහිත ලිපියක් වර්තමානයේ අධ්‍යාපනය ලබන පාසලේ විදුහල්පති මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

## 06. ශිෂ්‍යත්ව නියාමනය

**6.1** තෝරාගනු ලැබූ ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛනය පළාත් මට්ටමින් හා කලාප මට්ටමින් සහ පිළියෙල කර එම නාම ලේඛනය ජනාධිපති අරමුදල විසින් එක් එක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත යොමු කරන අතර කලාප මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම ඔවුන් ඉගෙනුම ලබන පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු ය. ඒ සඳහා සම්බන්ධීකරණ නිලධාරියකු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කළ යුතු ය.

**6.2** පළාත් මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අදාළ පළාත් අධ්‍යාපන ලේකම්වරුන්/ අධ්‍යක්ෂවරුන් විසින් සිදුකළ යුතු අතර ඒ සඳහා වන වගකීම සම්බන්ධීකරණ නිලධාරියකුට පැවරිය යුතුය.

**6.3** ජාතික මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය හා ජනාධිපති අරමුදල විසින් සිදුකරනු ඇත.

## 07. ශිෂ්‍යත්ව අවලංගු කිරීම

7.1 පහත සඳහන් හේතු මත මෙම ශිෂ්‍යත්වලාභීන් වෙත ලබාදෙන ශිෂ්‍යත්ව අවලංගු කිරීමේ බලය ජනාධිපති අරමුදල සතුවේ.

I. ශිෂ්‍යත්වලාභියා විනය විරෝධි හැසිරීම සඳහා දඬුවම් ලැබීම.
II. අඛණ්ඩ ව පාසලට නොපැමිණීම.
III. අඛණ්ඩ ව අධ්‍යාපන කටයුතුවලින් බැහැර වීම.
IV. අ.පො.ස.(උසස් පෙළ) අධ්‍යාපනය සම්පූර්ණ නොකර පාසලෙන් ඉවත් වීම.
V. ගාස්තු ගෙවනු ලබන /ජාත්‍යන්තර පාසලකට ඇතුළත් වීම.

## 08. කාලරාමුව

| | කාර්යය | කාලය (අදාළ කාර්යය සිදුකළ යුතු අවසන් දිනය) |
|---|---|---|
| 8.1 | අයදුම්පත් කැඳවීම | 2024 මැයි මස 03 දින |
| 8.2 | සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතික කරන ලද ලේඛන ද සමඟ ජනාධිපති අරමුදල වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම. | 2024 මැයි මස 22 දින / ඊට පෙර |
| 8.3 | ජනාධිපති අරමුදල විසින් ශිෂ්‍යත්වලාභීන් කලාප අනුව වර්ගීකරණය කර තෝරාගත් ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛන සකස් කිරීම. | 2024 මැයි මස 30 දිනට පෙර |
| 8.4 | තෝරා ගත් ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛන ජනාධිපති අරමුදලේ නිල Face Book පිටුවේ පළ කිරීම හා කලාප හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත තෝරාගත් ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛන ලබා දීම. | 2024 මැයි මස 30 දිනට පෙර |

ඉහත කාර්ය සිදු කර අවසන් වූ වහාම තෝරාගත් ශිෂ්‍යත්වලාභීන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සිදුකරනු ඇත.

මෙම චක්‍රලේඛයෙන් පැන නගින කිසියම් ගැටලුවක් ඇත්නම් ඒ පිළිබඳව ජනාධිපති ලේකම් ද විමසා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් අවසාන තීරණය ගනු ඇත.

ජේ.එම්.තිලකා ජයසුන්දර
ලේකම්

පිටපත් :- 01. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
02. ලේකම්, ජනාධිපති අරමුදල